මේ ඔබ අමතන්නේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ප්‍රචාරක අංශයයි.

වෙන්නප්පුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පවුල් 500 කට අධික පිරිසක් පසුගිය මාස කීපය තුළ ඇති වූ අධික වර්ෂාව නිසා පිඩාවට පත්විය. අවිධිමත් ඉඩම් කොටස් කිරීම් ,ඉඩම් ගොඩ කිරීම් හා අවිධිමත් ඉදිකිරිම් එයට ප්‍රධානම හේතුව වී ඇති බව නිරික්ෂණය වී ඇත. අනුමැතියකින් තොරව එවැනි කටයුතු සිදුකරන අය පිලිබඳව තොරතුරු කඩිනමින් වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ ප්‍රධාන කාර්යාලය වෙත හෝ අදාල උප කාර්යාල වෙත දැනුම්දෙන ලෙස කාරුණිකව ඉල්ලමි. අනුමැතියකින් තොරව එවැනි කටයුතු සිදුකරන අයට විරුද්ධව නිතිමය පියවර ගන්නා බවද මෙයින් දන්වා සිටිමි.

ගොඩනැගිලි සැලසුම අනුමත කිරීමෙන් පසු වසරක කාලයක් සඳහා පමණක් එය වලංගු වන බැවින් ඉන් ඉදිරියට කාලය දිර්ඝ කිරිමක් හෝ එම වසරක කාලය ඇතුලත අනුකූලතා සහතිකය ලබා ගැනිම අනිවාර්ය වන බවද මෙයින් දන්වා සිටිමි.

වෙන්නප්පුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් මිළදීගැනීමට ප්‍රථම එම ඉඩමේ පිඹුරුපත හා ගොඩනැගිලි සැලසුම් අනුමත වී තිබේදැයි වෙන්නප්පුව ප්‍රධාන කාර්යාලයෙන් හෝ උප කාර්යාල මගින් තොරතුරු සොයාබලා සනාථ කරගන්නා ලෙස මෙයින් දන්වා සිටිමි.

ඔබ විසින් දැනට පරිහරණය කරන ඉඩම හා ගොඩනැගිල්ලට අදාළ සැලසුම මේ දක්වා අනුමත කර නොමැති නම් හෝ ඊට අදාල අනුකූලතා සහතිකය ලබා නොමැති නම් එය ලබා ගැනීමට කටයුතු කරන්න.ඒ පිළිබද වැඩිදුර විස්තර ඔබට ආසන්නම ප්‍රාදේශිය සභා උප කාර්යාලයෙන් හෝ ප්‍රධාන කාර්යාලය මගින් ලබා ගත හැකිය.

ස්තූතියි!